www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉලිනොයිස් මැතිවරන මන්ඩලය ශැම්පේන්වල සසප අපේක්ෂකයා ඡන්ද පත්‍රිකාවට ඇතුල් කරයි

## Champaign, Illinois Electoral Board places SEP candidate on balot

**වාර්තාකරුවන් පිරිසක්**
**2004 අගෝස්තු 03**

ශැම්පේන් කොට්ඨාසයේ මැතිවරන කොමිසම සමාජවාදී සමානතා පක්ෂයේ ව්‍යවස්ථාදායක මන්ඩල අපේක්ෂක ටොම් මැකමන්ගේ නාම යෝජනා පෙත්සම්වලට එරෙහිව ගොනුකර තිබූ අභියෝගයන් ඉල්ලා අස් කරගැනීම නිල වසයෙන් පිලිගත් අතර නොවැම්බර් 2වන දා පැවැත්වෙන මැතිවරනයට මැකමන්ගේ නම ඇතුලත් කරන ලෙස ඉලිනොයිස් මැතිවරන මන්ඩලයට නියෝග කලා ය. මෙම ක්‍රියාමාර්ගය මැකමන්ගේ නාමයෝජනා පත්‍රයට අත්සන් තැබූ සියගනනක් වූ නීත්‍යනුකූලව ලියාපදිංචි ඡන්ද දායකයන්ගේ අත්සන් ප්‍රතික්ෂේප කරවීම හරහා සසප අපේක්ෂකයා මැතිවරනයෙන් ඉවත් කර තැබීමට ඩිමොක්‍රැටික් පක්ෂය මාසයක් තිස්සේ ගෙනගිය ව්‍යාපාරය අවසන් කර දැමී ය.

මැතිවරන කොමිසමේ තීරනය සසප ලද ජයග්‍රහනයක් වන අතර ජූනි 26 වන දා ශැම්පේන් කොට්ඨාසයේ ප්‍රමුඛ ඩිමොක්‍රැටික් පක්ෂ නිලධරයකු මැකමන්ගේ නාමයෝජනා පත්‍රයට විරෝධතා ගොනුකල තැන් පටන් මැකමන් සහ ඔහුගේ ආධාරකරුවන් විසින් ගන්නා ලද ස්ථාවරය නිවැරදි බව ද සනාථ කරයි. ආරම්භයේ පටන් ම සසප යේ සහ ඩිමොක්‍රැටික්වරුන්ගේ අභියෝගය පදනම් විරහිත හා වංචනික බව ද ඡන්ද පත්‍රිකාවට ඇතුලත් වීමට අවශ්‍යවන සුදුසුකම් සහිත අත්සන් ප්‍රමානයට වඩා බොහෝ වැඩි අත්සන් ප්‍රමානයක් මැකමන් සතු බව ද කියා සිටියේ ය.

මාසයක් තිස්සේ කල බාධාවන්ගෙන් අනතුරුව, අවසානයේදී ජූලි 27 වන දා මැතිවරන කොමිසමේ පරීක්ෂනයෙහි දී සිය ගනනක් අත්සන්වලට එරෙහිව ඔවුන් නැගූ අභියෝගයන් සනාථ කිරීමට ඩිමොක්‍රැටික්වරුන්ට සිදුවුනු අතර එය සපුරා ලීමට ඔවුන්ගේ නියෝජිතයෝ අපොහොසත් වූහ. දින කීපයකට පසුව සිය විරෝධතා ඉල්ලා අස් කර ගැනීමට ඩිමොක්‍රැටික්වරුන්ට සිදු වින.

සඳුදා පැවැත්වූ මැතිවරන කොමිසමේ විභාගයට මැකමන්ව ඉවත් කර තැබීමට සම්බන්ධවූ ඩිමොක්‍රැටික් නිලධාරීහු හෝ ඔවුන්ගේ නීතිඥවරු හෝ සහභාගී නො වූහ. දහවල් 1.00ට රැස්වූ කොමිසම, අභියෝගයට මුල පිරූ ශැම්පේන් කොට්ඨාස ඩිමොක්‍රැටික් උප සභාපති වන ජෙරල්ඩීන් පාර් නියෝජනය කල නීතිඥයා විසින් ඊට පෙර සතියේ දී විරෝධතාකරුගේ පෙත්සම ඉවත් කර ගැනීමට ඉදිරිපත් කර තිබූ මෝසම පිලිගන්නා ලදි. මැකමන් ඉදිරිපත්කල 2003 වු අත්සන් වලින් අඩකට වැඩි ප්‍රමානයක් වලංගු නොවන ඒවා බවට පාර් මුලින් පවසා තිබුනි.

අනතුරුව මැතිවරන කොමිසම ඡන්ද පත්‍රිකාවේ සසප අපේක්ෂකයාගේ නම සහ ඔහුගේ පක්ෂය සඳහන් කරන ලෙස ප්‍රාන්ත මැතිවරන මන්ඩලයට නියෝගයක් නිකුත් කලා ය. තීරන දෙකම ඒකමතික වූ අතර නඩු විභාගය මිනිත්තු ගනනක දී අවසන් වූයේ මැතිවරන කොමිසම නියෝගයට අත්සන් තබා එහි පිටපතක් මැකමන්ට දෙමින් ය.

ශැම්පේන් කොට්ඨාස උසාවි ශාලාව පිටත මැකමන්: ප්‍රාදේශීය එන්බීසී-ටීවී ප්‍රවෘත්ති ජාලය, විල් ගුවන් විදුලිය, ඉලිනොයිස් සරසවි සිසු පුවත්පත වන *ඩේලි ඉලිනි* වාර්තාකරුවන් ඇතුලු රූපවාහිනී, ගුවන්විදුලි, සහ මුද්‍රිත මාධ්‍යකරුවන් ගනනාවක් සම්බන්ධවූ පුවත්පත් සාකච්ඡාවක් පැවැත්වීය. එහිදී ඔහු කලින් සකස්කරන ලද ප්‍රකාශයක් කියවූ අතර සසප ප්‍රතිපත්ති සහ ඩිමොක්‍රැටික්වරුන්ගේ වංචනික අභියෝගය ජය ගැනීමට ගෙන යන පන්ති සටන පිලිබඳ ප්‍රශ්නවලට පිලිතුරු සැපයූවේ ය.

විල් ගුවන් විදුලියේ වාර්තාකරුවෙකු සසප නාමයෝජනා පත්‍රවලට එරෙහිව අභියෝග කිරීම සඳහා ඩිමොක්‍රැටික් පක්ෂය රජයේ සේවකයන් යොදවා ගැනීම පිලිබඳව විමසුවේ ය. සසප පොලිස්පති කාර්යාලයට මේ පිලිබඳව පැමිනිල්ලක් කර තිබෙන බව පැවසූ මැකමන් එහිදී මැතිවරන රෙගුලාසි සහ රාජ්‍ය ආචාරධර්ම නීති උල්ලංඝනයක් වීදැයි විමර්ශනය කිරීම සඳහා ඔවුන් පැමිනිල්ල ඉලිනොයිස් මන්ත්‍රන සභාවේ ආචාර ධර්ම කොමිසම වෙත යොමු කර තිබෙන බවද පැවසී ය.

මැකමන් ඔහුගේ ප්‍රකාශයේ දී සසප භාරගෙන ඇති සටනේ වැදගත්කම සහ ඇමරිකාව පුරා ද ජාත්‍යන්තරවද ප්‍රජාතන්ත්‍ර අයිතීන්හි ආරක්ෂකයන් එය පුබුදුවා ලමින් දැක්වූ ප්‍රතිචාරය ද පැහැදිලි කලේ ය. ඔහු මෙසේ පැවසී ය: ‘‘මෙම තීන්දුව ප්‍රජාතන්ත්‍ර

අයිතීන්ගේ ද ශැම්පේන් - උර්බානා ඡන්ද දායකයන්ගේ මෙන්ම එය සමස්ත ඡන්ද දායකයේ ම ජයග්‍රහනයකි. මෙය කථානායක මිකායෙල් මැඩිගන් ද ඇතුලුව ඉලිනොයිස්හි ඩිමොක්‍රැටික් පක්ෂ යන්ත්‍රනයේ නායකයන් ලද පරාජයකි. මෙම දිස්ත්‍රික්කයෙහි ඡන්ද දායකයන්ගේ අයිතීන් පාගා දමමින් ප්‍රධාන ව්‍යාපාරික පක්ෂ ද්විත්වයම පිලිගන්නා වූ යුද න්‍යාය පත්‍රයට ද ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හකුලා දැමීමට ද මෙරටෙහි අධ්‍යාපනය හා සමාජ ආරක්ෂන ජාලයෙ හි ඉතුරු පහදුව විනාශකිරීමට ද එරෙහිව මෙම නගරයෙහි කම්කරුවන්ට හා ශිෂ්‍යයන්ට දේශපාලන විකල්පයක් ඉදිරිපත්වීම වැලැක්විය හැකි යයි ඔවුන් සිතා සිටියහ.

''ඩිමොක්‍රැටික් පක්ෂ නිලධාරීන් සමාජවාදී සමානතා පක්ෂයේ ස්ථිරසාර අධිෂ්ඨානය තේරුම් ගැනීමට අපොහොසත් වූවා පමනක් නොව ඔවුන් ඉලිනොයිසියේත්, ඇමරිකාව පුරාමත් සහ ඒකාන්ත වසයෙන්ම ලොව පුරාමත් කම්කරු ජනයා තුල පවතින බලගතු ප්‍රජාතන්ත්‍රීය ඒත්තු ගැන්වීම් ද තේරුම් ගැනීමට ද ඊට ප්‍රතිචාර දැක්වීමට ද අපොහොසත්වූහ. ඔවුන් අන්ධකාරයේ, වැසූ දොරවල් පිටුපසට වී මුලු සිදුවීමේම වූ ප්‍රත්‍යක්ෂ පැහැදිලි පක්ෂග්‍රාහී ස්වභාවය සැම විටම ප්‍රතික්ෂේප කරමින් සිටියහ.

''දහස් ගනනේ ජනතාව දිනපතා *ලෝක සමාජවාදී වෙබ් අඩවියෙන්* මෙම කතන්දරය කියැවූ අතර ඩිමොක්‍රැටික්වරුන්ගේ වංචනික විරෝධතා ඉවත දමන ලෙස ඉල්ලමින් ශැම්පේන් කොට්ඨාස ලේඛකාධිකාරීවෙත 150ක් වූ ඊ-මේල් ලිපි සංඛ්‍යාවක් යවා තිබේ. මෙම ලිපි ඉලිනොයිස්හි සිට ද දුසිමක් තරම් අනෙකුත් ඇමරිකානු ප්‍රාන්තවලින් මෙන් ම එංගලන්තය, ජර්මනිය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, කැනඩාව සහ අනෙකුත් රටවලින් ද ලැබුනේ ය. කොට්ඨාස ලේඛකාධිකාරීට ලියූ සැමට ස්තුති කිරීමට මට අවශ්‍යවන්නේ මෙම ජාත්‍යන්තර විමසීම් තීරනාත්මක වැදගත්කමක් දරන බැවිනි.

''සැම තැනකම වසන ජනයාට ඇමරිකාව තුල ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වන ප්‍රහාරය එ.ජ. මිලිටරිවාදය මගින් ලෝකයාට එල්ල කැරෙන අන්තරාය සමග නොබිඳියහැකි ලෙස බැඳී පවතින තීරනාත්මක ජාත්‍යන්තර ප්‍රශ්නයක් බව ගැඹුරින්ම දැනෙයි. ලොව පුරා දස ලක්ෂ ගනනක් 2002 දී ඉරාක යුද්ධයට විරුද්ධව පෙලපාලි දැක්වූහ. ඔවුහු ඇමරිකාවේ ද තමන්ගේ ම ආන්ඩුවලද මිලිටරිවාදී පිලිවෙත්වලට විරුද්ධ වූ අතර මෙම සාපරාධී යුද්ධය ගෙන යනු වස් එ.ජ. ආන්ඩුව ඇමරිකානු ජනයාගේ අභිලාෂයන් නොතකා හරිනු ද දකිති.

''ඩිමොක්‍රැටික්වරුන්ට මා ඡන්දයෙන් ඉවත් කර තැබීමට අවශ්‍යව තිබෙන්නේ ජනතාවගේ අතිමූලික අවශ්‍යතාවන් ආරක්ෂා කර ගැනීමටත් යුද්ධයට විරුද්ධවීමටත් ඔවුන්ට ඇති අයිතිය අහිමි කර දැමීමට ය. මෙය මෙසේ වන්නේ ඉතාම මූලික ගැටලු සියල්ලම සම්බන්ධව ඩිමොක්‍රැටික් පක්ෂයේ පිලිවෙත් බුෂ්ගේ හා රිපබ්ලිකන්වරුන්ගේ පිලිවෙත් සමග තත්‍ය ලෙසින්ම කිසිදු වෙනසක් නොදක්වන හෙයිනි. බොස්ටන්වල ඩිමොක්‍රැටික් ජාතික සම්මේලනය, කෙරී පරිපාලනයත් ඇමරිකානු පාලක ප්‍රභූවේ යුද්ධයේ සහ සමාජ ප්‍රතිගාමිත්වයේ කොල්ලකාරී පිලිවෙත් තව දුරටත් තීව්‍ර කිරීමට නොහැකිනම් දිගටම ගෙන යන බව ඔවුන් ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමක් විය.

''සමුලුව තුල දී බුෂ් හා යුද්ධය පිලිබඳව බැරෑරුම් විවේචනයන් තහනම් කැරින. යුද විරෝධී බැනර් දිගහැරි නියෝජිතයන් එලියට ඇද දැමින. යුද විරෝධියෙකු වසයෙන් වන කෙරීගේ ම අතීතය කපා හැරුන අතර ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ප්‍රතිපත්ති අකුරක් නැර බුෂ් පරිපාලනයට වඩා කාර්යක්ෂමව හා සමාන මෘගත්වයකින් ක්‍රියාවට නැගීමට තමන් කෙරෙහි විශ්වාසය තැබිය හැකි යයි ඩිමොක්‍රැටික් අපේක්ෂකයා පෙන්නුම් කලේ ය.

''විදේශයන්හි කැරෙන මිලිටරි ආක්‍රමනය නොවැලැක්විය හැකි ලෙසට රට තුල ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහි ප්‍රහාරයන් තීව්‍රකිරීමට අවශ්‍ය කෙරෙයි. මෙම යුද්ධයේත් ඉදිරියේ ඇතිවන ඒවායේත් මානුෂික සහ මූල්‍ය පිරිවැය එකඟ නොවන ජනතාවන් මත බලෙන් පැටවිය හැකි එකම මග එයයි.

''ශැම්පේන්-උර්බානා තුල ඡන්ද අයිතියට එල්ලකල ප්‍රහාරයේ අර්ථභාරය රඳා පවතින්නේ මෙහි ය. බොස්ටනයේදී අල් ගෝර් වැනි ඩිමොක්‍රැටික් කථිකයන් 'සැම ඡන්දයක්ම ගනන් කිරීමේ' වැදගත්කම පිලිබඳව කයිවාරු ගසන අතරේ ඉලිනොයිස්හි පක්ෂ නියෝජිතයෝ, 2000 මැතිවරන හොරකම සඳහා ෆ්ලොරිඩාවේදී රිපබ්ලිකන්වරු භාවිත කල ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රමවේදයන්ම යොදාගත්හ. සසපය එකම ඉලක්කය ද නොවී ය. මැඩිගන් සහ ඩිමොක්‍රැටික්වරු ස්වාධීන ජනාධිපති අපේක්ෂක රැල්ෆ් නාඩර් ගොනුකල අත්සන් 32,000 අතරින් 20,000කට අභියෝග කරති.

''මතුපිටින් නම් ඩිමොක්‍රැටික් පක්ෂය සහ සසපය අතර ගැටුම කරට කර නොවූවක් ලෙස පෙනුනා විය හැක. කොහොම නමුත් ඩිමොක්‍රැටික්වරුන්ගේ භාවිතය සඳහා බලගතු සහ දූෂිත දේශපාලන යන්ත්‍රනයක්, දස ලක්ෂ ගනන් ඩොලර්, මිල අධික නීතිඥවරු, සහ බඳු ගෙවන්නන්ගෙන් වැටුප් ලබන රජයේ නිලධාරීන් පවා සිටියහ. නීතිය කැඩීමක් මත මෙය දැනට ව්‍යවස්ථාදායකයේ ආචාරධර්ම කොමිෂම මගින් විමර්ෂනය කෙරේ.

''මෙම විකාරයට එරෙහිව පිහිටීමට සසපයට හැකි වූයේ කෙසේ ද? අප පදනම් වූයේ ජනගහනයේ අතිමහත් බහුතරයේ අවශ්‍යතාවන් මත ය. එනම් මහා ව්‍යාපාරිකයන් වෙනුවෙන් හඬනගන පක්ෂ විසින් දේශපාලනිකව අයිතීන් අහිමිකර ඇති ලොව වටා සිටින කම්කරුවන් සහ ශිෂ්‍යයන් මත ය. ඔවුන් සතු සම්පත් තිබියේ වුව ද මෙම පක්ෂ පදනම්ව තිබෙන්නේ

වඩවඩාත් තුනීවෙමින් තිබෙන සමාජ පදනමක් මත බවත් ඔවුන්ගේ යුදවාදී හා ව්‍යාපාර හිතවාදී ප්‍රතිපත්ති විසින් පොදු ජනතාව තුල ඔවුන්ට ඇති සහයෝගය තව දුරටත් ඛාදනය වන බවත් අපි වටහා ගෙන සිටියෙමු.

''මෙම ප්‍රජාතන්ත්‍රවිරෝධී ප්‍රහාරය පරාජය කිරීම ඉතා වැදගත් පියවරක් වුව ද එය තව දුරටත් තීව්‍ර කල යුතු දැනට කෙරීගෙන යන අරගලයේ එක් පරිච්ඡේදයක් පමනි. ශැම්පේන්-උර්බානා අත්දැකීම කුඩා අනුරුවක් ලෙස පෙන්නුම් කැරෙන්නේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් සුරැකීමට, සාමයට සහ සමාජ සමානතාවයට අව්‍යාජව කැපවූ වැඩකරන ජනතාවගේ පලල් ව්‍යාපාරයක් ගොඩනැගීමට තිබෙන ශක්‍යතාවය යි. සමාජවාදී සමානතා පක්ෂය කැපවී ඇත්තේ මේ සඳහා ය. මා මෙම මැතිවරනයට තරග වදින හේතුව ද එය යි.''

© www.wsws.org